# බෞද්ධ සදාචාර දර්ශනයේ බුද්ධිමය පදනම

- කිරම විමලතිස්ස හිමි

දර්ශනය (Philosophy) නැමති පුළුල් විෂය ක්ෂේත්‍රයේ එක් ප්‍රධාන ශාඛාවක් වශයෙන් සදාචාර දර්ශනය හෙවත් ආචාර විද්‍යාව (Moral philosophy or Ethics) හැඳින්විය හැක. ආචාර ධර්ම වශයෙන් හැඳින්වෙනුයේ මිනිසාගේ හැසිරීම් පිළිබඳව කර තිබෙන යම් යම් ප්‍රාමාණික ඇගයීම්ය.[1] එහි දී මානව ගති පැවතුම් චර්යා මෙන්ම පර්මාර්ථ නිවැරදි මාවතක පවත්වාගෙන යන්නේ කෙසේද යන්න පිළිබඳව විවිධ මිනුම් දඬු ඔස්සේ විග්‍රහ කර තිබේ. සාමාන්‍ය ජන සමාජයේ ද මේ පිළිබඳව විවිධ අයුරින් කළ ඇගයීම් දැකිය හැකිය. එහෙත් සදාචාර දර්ශනය තුළින් හරි-වැරදි, හොඳ-නරක, යුතු-අයුතු ආදී වශයෙන් පවත්නා ඇගයීම් පිළිබඳව නිවැරදි තීරණය ගැනීම සඳහා තර්කානුකූලව හා දාර්ශනික වශයෙන් යම් යම් නිර්ණායක ඉදිරිපත් කිරීම සිදුවේ. අප යමක් හරි - වැරදි වශයෙන් නිගමනය කිරීමට නම් එකකට වඩා අනික නිවැරදි යැයි තීරණය කිරීමට පදනමක් තිබිය යුතුය. තමාගේ මතය හා ගැලපෙන නිසා හෝ නිවැරදි යැයි පෙනෙන නිසා හෝ එය තීරණය කිරීම යුක්ති සහගත නොවේ. ඒ සඳහා සියල්ලන්ටම පොදුවේ පිළිගත හැකි පදනමක් තිබිය යුතුය. ආචාර විද්‍යාව මගින් සිදුකර තිබෙන්නේ එසේ පොදු නිර්ණායකයක් ඉදිරිපත් කිරීමය. ආචාර විද්‍යාව ප්‍රධාන බෙදීම් තුනක් යටතේ සාකච්ඡාවේ.



1. ප්‍රාමාණික ආචාර විද්‍යාව (Normative ethics)
2. අධි ආචාර විද්‍යාව (Meta ethics)
3. ව්‍යවහාරික ආචාර විද්‍යාව (Applied ethics)

ප්‍රාමාණික ආචාර විද්‍යාව යටතේ අධ්‍යයනය කරනු ලබන්නේ හොඳ-නරක ආදී වශයෙන් ඉදිරිපත් කරන ආචාර විද්‍යාත්මක ඇගයුම්වල සහේතුක පදනමක් ඇත් ද යන්නයි. මෙය ප්‍රධාන මූල ධර්ම දෙකක් යටතේ විග්‍රහ කෙරේ එනම් සාධ්‍යතාවාදී මූලධර්මය (Teleological Theory) සහ යුක්ත්‍යාත්මවාදී මූලධර්මය (DeontologicalTheory) යනුවෙනි. මින් පළමු වැන්න තුළින් අවධාරණය කරනු ලබන්නේ යමක් කිරීමට පෙර අතීත අත්දැකීම් ආශ්‍රයෙන් හෝ ස්වකීය චින්තන ශක්තිය තුළින් ක්‍රියාවේ ප්‍රතිඵල නිරීක්ෂණය කිරීමට සලස්වා ඒ තුළින් ක්‍රියාවෙන් අපේක්ෂිත පරමාර්ථය සාධනය කළ හැකිදැයි සොයා බැලීමයි. දෙවැන්න තුළින් අවධාරණය කරන්නේ ඵල අපේක්ෂාවකින් තොරව සදාචාරාත්මක ක්‍රියාවන්හි නිරත වීමයි. උදාහරණයක් ලෙස යුතුකම්, යුතුකම් වශයෙන් පමණක් සිතා ඉටුකිරීමය.

සදාචාර සංකල්ප දාර්ශනික ස්ථරයක සාකච්ඡා වන්නේ අධි ආචාර විද්‍යාව තුළ ය. මෙහිදී සදාචාර ප්‍රකාශන වල පවත්නා තාර්කික බව පැහැදිලි කරයි. එහි දී හරි-වැරදි, හොඳ-නරක වැනි සදාචාරාත්මක පද හෝ සදාචාරාත්මක සංකල්පවල පවත්නා අර්ථය, තාර්කික බව දාර්ශනිකව විග්‍රහ කිරීමට උත්සාහගනු ලැබේ.[2]

ව්‍යවහාරික ආචාර විද්‍යාව තුළ දී විශ්ලේෂණයට ලක්කරන්නේ සමාජය තුළ විවිධ මතභේදයන්ට ලක්වූ සදාචාරාත්මක ගැටලු පිළිබඳවය. එනම් ගබ්සාව (Abortion), සත්ව අයිතීන් (Animal rights), සානුකම්පිත මරණ (Euthanasia) වැනි ප්‍රශ්න පිළිබඳව සමාජයේ විවිධ මතවාද පවතී. ව්‍යවහාරික ආචාර විද්‍යාව තුළ මෙවැනි ප්‍රශ්න දාර්ශනිකව විග්‍රහ කිරීමට උත්සාහගෙන ඇත.[3]

ඉහත කෙටියෙන් දැක්වූයේ බටහිර දර්ශනය (Philosophy) තුළ පැණෙන ආචාර ධර්ම (Ethics) සහ එහි විෂයක්ෂේත්‍ර පිළිබඳවය. බෞද්ධ ආචාර ධර්ම පිළිබඳව කථා කිරීමේදී ඉහත සඳහන් කළ පරිදි පසුකාලීනව බටහිර දර්ශනය තුළ වර්ධනය වූ 'ආචාර ධර්ම' වශයෙන් හඳුනාගන්නා ලද විවිධ එළඹුම් හා න්‍යායාත්මක සිද්ධාන්ත මතම පිහිටා නොමැති වුවත් බෞද්ධ දර්ශනය තුළ සෑම අංශයක්ම නියෝජනය වන අයුරින් සැදුම්ලත් සදාචාරාත්මක වශයෙන් බෙහෙවින් වැදගත් අදහස් දැකගත හැකිය. ආචාර ධර්ම හැදෑරීමේ උනන්දුවක් ඇති පුද්ගලයන්ගේ සැලකිල්ල යොමු කිරීමට තරම් වැදගත් එකී අංශ සදාචාරාත්මක වශයෙන් පෝෂිත අරුත්බර වාග් මාලාවකින් සැදුම් ලද්දේ වේ. මෙම බුද්ධ දේශනාව තුළ සදාචාර දාර්ශනිකයන්ට තම මතවාද නව මාවතකට යොමුකිරීමට තරම් වැදගත් දාර්ශනික අතින් ඉහළ තලයක පිහිටා ඇති ඉගැන්වීම් දැකගත හැකිය.

බුදු දහමේ සදාචාරය පිළිබඳව කථා කිරීමේදී එහි පරම නිෂ්ඨාව වශයෙන් හඳුන්වන නිර්වාණය සදාචාර පාරප්‍රාප්තියේ කෙළවර වශයෙන් දක්වා ඇත. ක්‍රමානුකූලව සදාචාරාත්මක පියවර සම්පූර්ණ කරමින් එයට ළඟාවිය යුතුය. බුදු දහමේ සදාචාරාත්මක කරුණු පිළිබඳ පැහැදිලි වැටහීමක් නොමැති සමහර විචාරකයන් බුදුදහමේ ඉගැන්වෙන නිර්වාණය සදාචාර සීමාවෙන් ඔබ්බෙහි ඇති දෙයක් ලෙසට අර්ථ නිරූපණය කර තිබේ. බුදුදහමේ ඉගැන්වෙන සදාචාර ඉගැන්වීම් පිළිබඳව අධ්‍යයනයක යෙදුණු එස්. තච්බානා මහතා

"භික්ෂුව බ්‍රාහ්මණයා සහ බුදුරජාණන් වහන්සේ යන මොවුහු හොඳ නරක, ප්‍රසන්න - අප්‍රසන්න, පාරිශුද්ධ-අපරිශුද්ධ ආදී වශයෙන් ඇති විශේෂතාවයන්ගෙන් මිදුණු පුද්ගලයෝ වෙති. මෙකී ශ්‍රේෂ්ඨ තත්වයට කෙනෙකු ළඟාවීමත් සමග විශේෂ සංකල්පනා සහමුලින්ම අභාවයට පත්වෙයි. එකී පුද්ගලයා සදාචාරාත්මක සෞන්දර්යාත්මක හෝ තාර්කික විශේෂතා



පිළිබඳ හැඟීමක් නොමැති මානසික තත්වයකට පත්වෙයි. එහෙත් හොඳ-නරක, සැප-දුක, ප්‍රිය-අප්‍රිය, සහ හරි-වැරදි යන සියලු සාපේක්ෂ සංකල්පනා ඔහු සම්බන්ධයෙන් ශූන්‍ය වූ තත්වයට පත්වෙයි."[4]

මෙය බුදුදහම සම්බන්ධව නිවැරදි නිගමනයක් නොවේ. බුදු දහමට අනුව නිර්වාණාවබෝධයට පත්වීම යනු පුද්ගලයා නිෂ්ක්‍රීය වීමක් නොවේ. එහිදී සිදුවන්නේ සියලු පාපී හෝ අකුසල සිතුවිලි වලින් ඉවත් වී කුසල ධර්මයන් උපරිම අයුරින් වර්ධනය වීමයි. බුදු දහමේ ඉගැන්වෙන සදාචාරයේ කෙළවරට ගමන් කිරීමය. ඉන් අනතුරුව කිසිදු අයුරකින් අකුසල සහගත ක්‍රියාවක නොයෙදන බැවින් සදාචාරයේ පරිපූර්ණත්වයට පත්වූ පුද්ගලයෙකු වශයෙන් නිර්වාණ ප්‍රාප්ත පුද්ගලයා හැඳින්වේ.

ආචාර ධර්ම පිළිබඳව කථා කිරීමේදී එහි බුද්ධිමය පදනමක් පිළිබඳව කථා කළ නොහැකි බව තහවුරු කිරීමට මෑත යුගයේ ඇතැම් දාර්ශනිකයන් උත්සාහ ගෙන ඇත. ඩේවිඩ් හියුම් (David Hume) මේ පිළිබඳව සාකච්ඡා කළ එක් ප්‍රකට දාර්ශනිකයෙකි. ඔහු දක්වන ආකාරයට සදාචාරාත්මක රීති අපගේ බුද්ධියේ සීමාවන් ඉක්මවාගොස් සිදුකරන විනිශ්චයන් ගණයට අයත්වේ.[5] තවද මිනිසුන් තම තමන්ගේ මත අභ්‍යන්තර රුචි අරුචිකම් මගින් ප්‍රකාශ කරනවාය යන්න ද ආචාර විද්‍යාවේදී එක් මතයකි.[6] එහෙත් යුක්ත්‍යාත්මවාදී දාර්ශනිකයින් ප්‍රකාශ කරන ආකාරයට සදාචාරාත්මක ඇගයුම්වල පදනම බුද්ධියයි. මෙම න්‍යාය පැහැදිලි ලෙසම සදාචාරාත්මක විශ්ලේෂණය සඳහා යොදාගනු ලැබුවේ ඉමැනුවෙල් කාන්ට් (Immanuel Kant) විසින් ය.[7]

බුද්ධිමය පදනම පිළිබඳ ප්‍රශ්නයක් මතුවන්නේ එක් පුද්ගලයෙක් "නිවැරිදි" වශයෙන් දක්වන චර්යාවක් තවකෙක් "වැරදි" වශයෙන් ඇගයීමක් කළ විටය. මෙහිදී ඒ දෙදෙනා

අතරින් කවරෙක් නිවැරදි දැයි තීරණය කළ යුතුය. මෙය තර්කානුකූලව ද නිගමනය කළ නොහැක. මන්ද එය අප එකිනෙකට විශේෂ වූ යම් හැඟීමක් පිළිබඳ කරන නිගමනයක් නිසාය. මේ පිළිබඳ බෞද්ධ විග්‍රහය දැක්වීමේ දී අවධානය යොමු කළ යුතු වැදගත් පැති කිහිපයක් පෙන්වාදිය හැක. අප ඉදිරිපත් කරන සදාචාරාත්මක නිර්දේශය තවත් කෙනෙකුට හේතු යුක්ති සහිතව ඒත්තු ගැන්විය හැකිද? පොදුවේ පිළිගත හැකි හේතු තිබේද? බුදුදහම තුළින් මෙකී ප්‍රශ්න සඳහා පිළිතුරු සෙවීමේ දී අපගේ අවධානය යොමුවිය යුතු වැදගත් සූත්‍ර කිහිපයක් ලෙස මජ්ඣිම නිකායේ බාහිතික සූත්‍රය, මජ්ඣිම නිකායේ අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය හා අංගුත්තර නිකායේ කාලාම සූත්‍රය දැක්විය හැක. 'බෞද්ධ සදාචාර දර්ශනයේ බුද්ධිමය පදනම' පිළිබඳව සාකච්ඡා කිරීමේදී මෙම සූත්‍ර අතිශය උපකාරී වේ.

බෞද්ධ සදාචාර විනිශ්චයේ සඳහන් වන වැදගත් කාරණයක් නම් ස්වාධීන විනිශ්චයකට අවකාශ සලසා දීමය. හරි-වැරදි, තීරණය කිරීමට පුද්ගලයාට ඉඩදීමෙන් ඔහු ස්වාධීන තීරකයෙක් වෙයි. එහෙත් මෙහිදී තමාගේ රුචිකත්වය මත තීරණය කිරීමට ඔහුට නොහැක.

'ප්‍රාණඝාතය වැරදි ක්‍රියාවකි'

මෙය වැරදි ක්‍රියාවක් වශයෙන් සලකන්නේ කෙසේද?, තමාට උපමා කිරීමෙන් එය තේරුම් ගත හැකි බව බුදුරදුන් විසින් දේශනා කර තිබේ. තමා එවැනි හිංසා පීඩාදියකට ලක්වීමට රුචිකත්වයක් නොදක්වන්නා සේ අන් අයද එවැනි තත්වයකට පත්වීමට අකමැතිය.

"සියල්ලෝ දඬුවමට තැති ගනිති. සියල්ලෝ මරණයට බිය වෙති. අනුන් තමාමෙන් සලකා හිංසා නොකළ යුතුය. කිසිවෙකු ලවා හිංසා නොකර විය යුතුය."[8]



සදාචාර විනිශ්චයේ දී පුද්ගලයා ක්‍රියාත්මක විය යුත්තේ කෙසේද යන්න හා එහි දී පුද්ගල ස්වච්ඡන්දතාව පිළිබඳව වෙසෙසින් සඳහන්වන සූත්‍රයක් ලෙස කාලාම සූත්‍රය දැක්විය හැකි ය. එහි දී පුද්ගලයා ස්වකීය ස්වාධීන චින්තනය යටපත් කොට සදාචාර විනිශ්චයන් පිළිබඳ නිගමනවලට පැමිණෙන ප්‍රඥප්ති තුළ සිරවී සිටින අයුරු හා බුදුරදුන් ඒවා ප්‍රාමාණික වශයෙන් නොසැලකිය යුතුයැයි වදාළ අයුරු මැනවින් පැහැදිලි වෙයි.

කේසපුත්ත නියම්ගම් වැසි කාලාමයන් බුදුරදුන් තම ගම් ප්‍රදේශයට පැමිණි අවස්ථාවේ ප්‍රකාශ කළේ තමන් වෙත පැමිණෙන නොයෙක් මහණ බමුණන් විසින් තමන්ට එකිනෙකට ප්‍රතිවිරුද්ධ අදහස් ඇති සදාචාරාත්මක උපදෙස් ලබාදෙන බවත්, ඒ අතරින් නිවැරදි දේ තෝරාගත යුත්තේ කෙසේදැයි තමන් නොදන්නා බවත් ය. එහි දී බුදුරදුන් ප්‍රකාශ කරන්නේ එවැනි සැකයක් ඇතිවීම සාධාරණ බවත්, එබැවින්ම සැක කළ යුතු තැන කාලාමයන් සැක කර ඇති බවත් ය. අනතුරුව බුදුරදුන් සදාචාර විනිශ්චයේලා පිළිගත හැකි සාධාරණ මිණුම් දණ්ඩක් ඉදිරිපත් කර ඇත. එසේම එකල බොහෝ දෙනා විසින් නිවැරදි විනිශ්චයන් ලෙස පිළිගත් කරුණු දහයක් ද ප්‍රාමාණිකව සැලකීම ද ප්‍රතික්ෂේප කර ඇත.

1. ශ්‍රැතියෙන් හෙවත් ශ්‍රවණයෙන් පැවත එන සංකල්ප, 2. පරම්පරාවෙන් පැවත එන සංකල්ප, 3. පෙළපොත් සම්ප්‍රදායෙන් පැවත එන සංකල්ප, 4. "මෙසේ වීය" යනුවෙන් අනුන් විසින් කියන සංකල්ප, 5. තර්කානුකූල සංකල්ප, 6. නය හෙවත් මූලධර්ම මත බැසගත් සංකල්ප, 7. මේ කාරණය සුන්දර යයි කරුණු සැලකීමෙන් එන සංකල්ප, 8. අපගේ දෘෂ්ටියට ගැලපේ යැයි සිතා පිළිගන්නා සංකල්ප, 9. අසවලාගේ කථාව විශ්වාසවන්තය ආදී වශයෙන් ඇතිවන සංකල්ප, 10. මේ ශ්‍රමණයා අපගේ ගුරුවරයා ය. එම නිසා මොහුගේ අදහස්

පිළිගත යුතුය යන පුද්ගල ප්‍රාමාණික සංකල්ප, මේවා බැහැර කළ අතර බුදුරදුන් විසින් හරි-වැරදි තමාටම තීරණය කළ හැකි මඟක් පෙන්වා දී ඇත.[9]

මේ ආකාරයට බුදුරජාණන් වහන්සේ ඔවුනට ස්වාධීන චින්තනයක් ගොඩනඟා ගන්නා ආකාරය පෙන්වා දී අනතුරුව ඔවුන්ට කිසිදු බලපෑමක් නොකර සදාචාරත්මක ප්‍රශ්න කිහිපයක් නඟා ඔවුන්ගේ අදහස් විමසා බැලුහ.

"කාලාමයෙනි, කුමක් සිතන්නේ ද? පුද්ගලයෙකුගේ අධ්‍යාත්මයේ හටගන්නා ලෝභය හිත පිණිස පවතින්නේද ? අහිත පිණිස පවතින්නේද ?"

"ස්වාමීනී හානිය සඳහාය"

කාලාමයෙනි, ලෝභයෙන් යුතු ලෝභයෙන් වඩනා ලද්දා වූ ලෝභයෙන් හාත්පසින් අල්වා ගන්නා ලද පුරුෂයා පරපණක් නසා ද, නුදුන් දැයක් ගණී ද පරඅඹුවන් කරාත් යේද, බොරුත් කියාද අන්‍යයන් ද ඒ සඳහා යොදවා ද යම් කාරණයකින් දිගු කල් පුරා අනර්ථයට හා දුකට පත්විය හැකි සිදුවීම් වේද එය පරපණ නැසීම ආදියෙනි.

"ස්වාමීනි එසේය"[10]

මේ ආකාරයට ද්වේශය, හා මෝහය පිළිබඳව ද අලෝභය, අද්වේශය හා අමෝහය පිළිබඳව ද විමසති. අවසානයේදී කාලාමයෝ මේවා අකුසල් බව ද, නුවණැත්තන් විසින් ප්‍රතික්ෂේප කරන ලද බව ද, බොහෝ කල් අහිත පිණිස දුක් පිණිස පවතින බව ද මේවා කුසල් යැයි ද හිතසුව පිණිස පවත්නා බව ද වටහා ගනිති.

මේ අයුරින් බුදුරදුන් කාලාමයන්ට උපදෙස් දෙන්නේ සදාචාර ධර්ම සම්බන්ධයෙන් අධිකාරි පිහිට නොසොයා ස්වතන්ත්‍රව විනිශ්චය කරන ලෙස ය. එහි දී බුදුරදුන් ඔවුන්ට කිසිම



බලපෑමක් නොකළ අතර නිවැරදි දේ තෝරාගන්නා ආකාරය පෙන්වා දී ඇත. ආචාර ධර්ම විනිශ්චයේ දී බුදුරදුන් ඉදිරිපත් කළ හරි-වැරදි දේ සම්බන්ධයෙන් කිසිදු ගැටළුවක් ඇති නොවූයේ ඒවා පුද්ගලයාගේ අත්දැකීම් අනුව තීරණය කිරීමට මග පෙන්වූ බැවිනි.

මජ්ඣිම නිකායේ බාහිතික සූත්‍රයේ දී මෙම ප්‍රස්තුතයට ආදාළ තවත් පැතිකඩක් නිරූපණය වේ. මෙහි ඇතුළත් වන්නේ ආනන්ද තෙරුන් හා කොසොල් රජතුමා අතර වූ සංවාදයකි. රජු ආනන්ද තෙරුන්ගෙන් ප්‍රශ්න විචාළේ ය. රජතුමා විසින් නඟන ලද්දේ 'ප්‍රශංසා කටයුතු' හා 'ගර්හා කටයුතු' හැසිරීම් අතර ප්‍රභේදනයක් ඇතිකිරීමට අවශ්‍ය බුද්ධිගෝචර ප්‍රශ්නයකි.

"නුවණැති මහණ බමුණන් විසින් ගර්හා කරන ලද කායික, වාචසික, මානසික හැසිරීම් කවරේදැයි රජතුමා ආනන්ද හිමියන්ගෙන් ප්‍රශ්න කරයි.[11]

"මහරජ යම් කාය සංවරයක් අකුසල්වේ ද එයයි"[12]

මෙම පිළිතුරෙන් සෑහීමට පත්නොවන රජතුමා නැවතත් ප්‍රශ්න නඟයි.

"වහන්ස, අකුසල කාය සංවර නම් කවරේ ද?[13]

"මහරජ යම් කාය සංවරයක් සාවද්‍ය වේද එයයි"[14]

මේ ආකාරයට දිගටම ප්‍රශ්න නඟන්නේ ලැබෙන පිළිතුරෙන් රජු සෑහීමකට පත් නොවන බැවිනි. අවසානයේදී ආනන්ද හිමියෝ අකුසල චර්යාව යනු කුමක්දැයි පැහැදිලි කරති.

"මහරජ යම් කාය සංවරයෙක් ආත්මව්‍යාබාධ පිණිස වැටේ ද, පරව්‍යාබාධ පිණිස වැටේ ද, උභයව්‍යාබාධ පිණිස වැටේ ද, ඔහුට අකුසල ධර්මයෝ වැඩෙත් ද, කුසල ධර්මයෝ පිරිහෙත්

ද, මහරජ කාය සංවරය නුවණැති මහණ බමුණන් විසින් උපාරම්භ කළ යුතු වෙයි.''[15]

මේ ආකාරයට වාක් සමාචාර හා මනෝ සමාචාර පිළිබඳව ද පැහැදිලි කරදෙයි. මෙයින් පැහැදිලි වන්නේ නුවණැත්තන් විසින් ගර්හා කරන්නේ කුමන චර්යාවන් ද යන්න ය. යම් චර්යාවන් තමා හා මෙරමා යන දෙපක්ෂයටම හානිදායක නම් එවැනි චර්යා ප්‍රතික්ෂේප කළ යුතුය. එය තීරණය කරන්නේ හුදෙක් හිතුමනාපයට නොවේ. ඒ සඳහා පොදුවේ පිළිගතහැකි සාධාරණ න්‍යායක් ඉහත සංවාදයේදී ඉදිරිපත්කර තිබේ.

බෞද්ධ ආචාර ධර්ම පිළිබඳ සඳහන් කිරීමේ දී 'ප්‍රත්‍යවේක්ෂණය' ඉතා වැදගත් ඉගැන්වීමකි. බුදුරදුන් විසින් විශේෂයෙන් භික්ෂූන්ට සිව්පසය පරිභෝගයේ දී ප්‍රත්‍යවේක්ෂා කිරීමට අනුදැන වදාරා තිබේ. ස්වකීය මූලික පරමාර්ථයේ පිහිටීම සඳහා එය මහෝපකාරී වේ. ආචාර විද්‍යාවේදී මෙය වැදගත් වන්නේ අප සිදුකිරීමට යන කායික, වාචසික හෝ මානසික ක්‍රියාවන් දෙස සුපරීක්ෂාකාරීව බැලීම තුළින් එම කිරීමට යන කාර්යය වඩාත් නිවැරදි කරගත හැකි බැවිනි. එම නිසා මෙය උසස් න්‍යායකි. බාහිතික සූත්‍රයේද මෙය සඳහන් වුවත් වඩාත් පැහැදිලි ලෙස එය "අම්බලට්ඨික රාහුලෝවාද" සූත්‍රයේ දක්වා ඇත.

අප සිදුකරන බොහෝ ක්‍රියා තුළින් අන්‍යයන්ට හිංසා, පීඩා විය හැකිය. පුද්ගලයෙකු විසින් පිරික්සා බැලීමෙන් තොරව, කායික, වාචසික, මානසික වශයෙන් කරන අප්‍රමාණ ක්‍රියාවන් ඇත. එකී ක්‍රියාවන් අපට නිවැරදි සේ පෙනුන ද අන්‍යයන්ට එය පීඩාවක් වීමට පුළුවන. ඒ නිසා බුදුරදුන් රාහුල තෙරුන්ට උපදෙස් දෙන්නේ ක්‍රියාවක් කිරීමට පෙර තමා මුල්තැන තබාගෙන එයින් වන ප්‍රතිඵල පරීක්ෂා කර බලන ලෙසය.



"රාහුලයෙනි තෙපි යම් කාය කර්මයක් කරනු කැමති නම් එම කාය කර්මය පිරික්සිය යුතු යැ....

"මම කයින් යම් කාය කර්මයක් කරනු කැමැත්තෙම් ද, මාගේ මේ කාය කර්මය තමහට දුක් පිණිස ද පවත්නේ ය. පරහට දුක් පිණිස ද පවත්නේ ය. දෙදෙනාටම දුක් පිණිස පවත්නේ ය. මේ කාය කර්මය අකුසල් දුක් වඩනේ ය. දුඃඛ විපාක ඇතැයි රාහුලයෙනි තොප විසින් කයින් මෙබඳු කාය කර්ම ඒකාන්තයෙන් නො කටයුතු ය.''[16]

නැවත ද කරන කාය කර්මය ඉහත ආකාරයේ දුක් පිණිස නොපවතී නම් එවැනි ක්‍රියාවන්හි නිරත වන ලෙස පවසයි. මේ ආකාරයට වාචසික හා මානසික ක්‍රියා ද පිරික්සීමෙන් පසුව සිදු කිරීමට හෝ නොකිරීමට දේශනා කර ඇත. බුදුරදුන්ගේ මෙම දේශනාව අනුව කෙනෙකු සිත, කය හා වචනය යන තිදොරින් වන ක්‍රියාවන්ගේ හරි-වැරදි බව විමසිය යුත්තේ එහි ප්‍රතිඵල අනුවය. ක්‍රියාව කිරීමට පෙර තමා කිරීමට යන ක්‍රියාවත් එහි ප්‍රතිඵලයත් කෙනෙකුට කල්තියා සිතිය හැකිය. ඒ සඳහා තමාගේ මෙන්ම අන්‍යයන්ගේ අතීත අත්දැකීම් ද උපයෝගී කරගත හැකි ය. තමාටත් අන්‍යයන්ට හානිදායක ක්‍රියාවක් නම් එය අකුසල ක්‍රියාවක් වශයෙන් ද තමාත්, අන්‍යයනුත් යහපතට පමුණුවන ක්‍රියාවක් නම් එය කුසල කර්මයක් වශයෙන්ද තීරණය කළ යුතු ය.

යමෙකු වරදක් කළ කල්හි ඒ වරද පිළිබඳව පසුතැවීමක් හෝ තමාටම දෝෂාරෝපණය කරගැනීමක් සිදුවන්නේ ඔහු දරණ සදාචාර ආකල්ප මත ය. එසේම එක් සමාජයක වරදක් ලෙස පිළිගන්නා ඇතැම් කරුණු වෙනත් සමාජයක වරදක් ලෙස නොපිළිගන්නා අයුරු දැකගත හැකිය. බුදුරදුන් ඇතැම් කරුණු අකුසල ලෙස සඳහන් කළ ද ඒවා වැරදි ලෙස නොසලකන පිරිසක් එකළ භාරතයේ පවා සිටි බව නොරහසකි. එහෙත් බුදුරදුන්ගේ අවධානය තවත් කරුණක් දෙසට යොමු වී ඇත.

සමාජ සම්මුති මගින් අදහස් උදහස් වෙනස් වුව ද ස්වභාව ධර්මයේ හේතුඵල න්‍යායමත ක්‍රියාත්මක වන ධර්මතා ඇති බුදුදහම එය කර්මය නමින් හඳුන්වයි. එනම් මේ ලෝක වශයෙන් කරන-කියන දේවල ප්‍රතිඵල මතු භවයට බලපාන අයුරු බුදු දහමෙන් විස්තර කෙරේ. ඒ අනුව අන් කිසිම දහමක හෝ සදාචාර විශ්ලේෂණයක සඳහන් නොවන මාවතකට බෞද්ධ සදාචාරය ගමන් කොට තිබේ. ඒ තුළින් පුද්ගලයා සදාචාරාත්මක හැසිරීම් සඳහා දිරිගන්වා ඇත. අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ මගින් චුතිය හා උප්පත්තිය පිළිබඳ තොරතුරු දැක කර්ම ඵල විපාක පිළිබඳව ද බුදු දහමේ විග්‍රහ කර ඇත. ඒ අනුව පුද්ගලයාගේ පැවැත්ම ඔහුගේ සදාචාරාත්මක චරිතය මත රඳා පවතින බව පැහැදිලි වේ.[17]

පුද්ගල නිදහසට බලපාන අධිකාරි ස්වරූපයේ ආචාර ධර්ම පද්ධතියක් බුදු දහමේ දක්නට නොමැත. සෑම කෙනෙකුටම හරි-වැරදි පහසුවෙන් වටහාගත හැකි පරිදි බුද්ධිමය තලයක මෙම ආචාර ධර්ම ඉදිරිපත් කර ඇති අයුරු දැකගත හැකිය. එය පහත සඳහන් සංයුත්ත නිකායේ පාඨයෙන් මනාව පැහැදිලි වේ.

"ආර්ය ශ්‍රාවක තෙමේ මෙසේ මෙනෙහි කරයි. මම ජීවත්වීමට කැමැත්තෙමි. මරණයට නොකැමැත්තෙමි. මම සැපතට කැමැත්තෙමි. දුකට නොකැමැත්තෙමි. මා ජීවත් වීමට කැමති හෙයින් ද දුකට නොකැමැති හෙයින් ද කෙනෙක් මා මරතී'යි යන සිතිවිල්ල මගේ සතුටට හා සොම්නසට හේතු නොවන්නේ ය. අන් තැනැත්තන් ද ජීවත්වීමට කැමති හෙයින් හා මරණයට අකමැති හෙයින් මවිසින් ඔවුහු මරණු ලබතියි යන සිතිවිල්ල ඔවුන්ගේ සතුටට හෝ සොම්නසට ද හේතු නොවන්නේය. මට සතුට හෝ සොම්නස පිණිස නොවන දේ සෙසු පුද්ගලයන්ට ද එසේම ය. තම සතුට හෝ සොම්නස පිණිස නොපවතින දෙයක් මම සෙස්සන්ට ඔවුන්ගේ නොකැමැත්තෙන් කෙසේ කරම්ද? මෙසේ මෙනෙහි කරන ආර්ය ශ්‍රාවක තෙමේ තමාම ප්‍රාණඝාතයෙන් වලකියි. සෙස්සන්ද ඉන් වැලැක්වීමට උත්සාහ ගනී"[18]



බුදු දහමේ ඉගැන්වෙන සදාචාර නිදහස තුළ තමාට ඇතිවන සදාචාර ගැටළු තමාගේම බුද්ධිමය විශ්ලේෂණය මගින් විසඳාගැනීමට ඉඩ සලසා ඇති බව කිව හැකි ය. එහෙත් එය පුද්ගලයාගේ හිතුමනාපයට විසඳා ගැනීමට ඉඩ සලසා නොමැති බව ඉහත ඉගැන්වීම් තුළින් මනාව පැහැදිලි වේ. සදාචාර නියුක්තිකයෙකු විසින් සදාචාර තීරණ ගැනීමේ දී අවධානය යොමු කළ යුතු මිනුම් දඬු ඇත. අප සදාචාර බව තීරණය කළ යුත්තේ සදාචාර අධිකාරියක විධාන මත පදනම්ව නොවේ. එහෙත් කෙනෙකු යෝග්‍ය සදාචාර විනිශ්චයක් ගෙනහැර පාන්නේ නම් එය පිළිගත යුතුය. බුදුරදුන්ගේ දේශනා වැදගත් කොට සැලකිය යුත්තේ හොඳ-නරක පිළිබඳ සම්‍යග් ඥානයක් උන්වහන්සේට තිබූ නිසා ය. මිනිසාගේ ජීවිතයේ සියළුම හරයන් පිළිබඳ පූර්ණ අවබෝධයක් උන්වහන්සේට තිබුණි. සදාචාරයේ ප්‍රතිමූර්තියක් වශයෙන් උන්වහන්සේගේ දැනුම අගය කළ හැකිය.

මේ ආකාරයට විමසා බලන විට බෞද්ධ සදාචාර දර්ශනයේ පවත්නා බුද්ධිමය පදනම පැහැදිලි වෙයි. එය තර්කයට හෝ අධිකාරි ස්වරූපයට යටත් නොවී සදාචාර විනිශ්චයේලා පොදුවේ එකඟ වියහැකි කරුණු හෙළිදරව් කිරීමක් වේ.

## ආන්තික සටහන්


1 Grayling, A.C., *Philosophy*, Oxford University press, Oxford.1995. p.546

2 Miller, C. *The Conditions of Moral Realism*. The Journal of Philosophical Research, 2009. 34, p.123-155.

3 Chadwick, R.F. Encyclopedia of Applied Ethics, Academic Press, London, 1997. p'554

4 ප්‍රේමසිරි පී.ඩී. *බෞද්ධ ආචාර ධර්ම*, බෞද්ධ විශ්ව කෝෂ සිංහල ග්‍රන්ථමාලා අංක 1, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ, 1997. 4 පිටුව

5 ධම්මානන්ද හිමි. හෝමාගම, *බෞද්ධ හා කාන්ටියානු සදාචාර දර්ශනය*, එස්, ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2004, 84 පිටුව.

6 කලංසූරිය ඒ. ඩී. පී. *නූතන බටහිර දර්ශනය*, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ, 1973. 230 පිටුව.

7 ධම්මානන්ද හිමි. හෝමාගම, *බෞද්ධ හා කාන්ටියානු සදාචාර දර්ශනය*, එස්, ගොඩගේ සහ සහෝදරයෝ, 2004, 88-89 පිටු.

8 ධම්ම පදය : දණ්ඩවග්ගය-1

9 අං.නි. II, කාලාම සූත්‍රය, බු.ජ.මු, 1973. 338 පිටුව.

10 අං.නි. II, කාලාම සූත්‍රය, බු.ජ.මු, 1973. 338 පිටුව.

11 ම. නි. II, බාහිතික සූත්‍රය, බු.ජ.මු. 1973. 544 පිටුව.

12 ම. නි. II, බාහිතික සූත්‍රය, බු.ජ.මු. 1973. 544 පිටුව.

13 ම. නි. II, බාහිතික සූත්‍රය, බු.ජ.මු. 1973. 544 පිටුව.

14 ම. නි. II, බාහිතික සූත්‍රය, බු.ජ.මු. 1973. 545 පිටුව.

15 ම. නි. II, බාහිතික සූත්‍රය, බු.ජ.මු. 1973. 545 පිටුව.

16 ම.නි. II, අම්බලට්ඨිකා රාහුලෝවාද සූත්‍රය, බු.ජ.මු 1973. 132 පිටුව.

17 ධර්මසිරි ගුණපාල, *බෞද්ධ සදාචාරයේ මූලධර්ම*, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 1996. 5-50 පිටු

18 සං.නි. V. බු.ජ.මු. 1973. 353-4 පිටු